# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2117/48 - 2019 අප්‍රේල් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2019.04.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

**3 වැනි වගන්තිය යටතේ නියමය**

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින් මෙහි උපලේඛනය I හි I වන තීරුවේ දක්වා ඇති 2015 ජනවාරි මස සිට 2017 නොවැම්බර් මස දක්වා කාලය තුළ ආනයනය කරන ලද මෝටර් රථ මත, අය කරනු ලබන සහ එකතු කරනු ලබන නිෂ්පාදන බද්ද වශයෙන් මෙහි උපලේඛනය I හි II වන තීරුවේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති බදු අනුප්‍රමාණයන් 2019 අප්‍රේල් මස 05 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවිය යුතු බව, ප්‍රකාශයට පත් කරමි.

ඉහත දක්වා ඇති විශේෂිත බදු අනුපාතයන් යටතේ කරන ලද ගෙවීම මත ඔහුගේ හෝ ඇයගේ මෝටර් රථය නිශ්කාෂණය කර ගැනීමට අදහස් කරන සහ මෙම නියෝගයේ උපලේඛනය I හි දක්වා ඇති කොන්දේසි සම්පූර්ණ කරන ඕනෑම පුද්ගලයකු හෝ ආනයනකරුවෙකු විසින් උපලේඛනය II හි සඳහන් ඔහුගේ හෝ ඇයගේ අයදුම් පත්‍රය 2019 අගෝස්තු මස 05 දින හෝ එදිනට පෙර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු වේ.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 මාර්තු මස 29 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1A - PG 4493 — 567 (2019/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

| විස්තරය<br>I | නිෂ්පාදන බද්ද<br>II |
|---|---|
| 1. 2015 ජනවාරි සිට 2017 නොවැම්බර් දක්වා කාලය තුළ ආනයනය කරන ලද සහ ශ්‍රී ලංකා වරාය (හම්බන්තොට) පරිශ්‍රයේ රඳවා ඇති රේගු නිශ්කාෂණයට නියමිත මෝටර් රථ සියල්ලම පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කරයි නම් අදාළ ණයවර ලිපිය විවෘත කරන ලද අවස්ථාවේ පැවති නිෂ්පාදන බද්ද ගෙවමින් එම වාහන නිශ්කාෂණය කිරීමට කටයුතු කිරීම.<br><br>(i) ඉහත සඳහන් මෝටර් රථ, පුද්ගලික පරිහරණය සඳහා තනි පුද්ගලයින් විසින් ආනයනය කර තිබීම හා අදාළ ණයවර ලිපිය ඔවුන්ගේ නමින් විවෘත කර තිබීම හෝ<br><br>(ii) ඉහත සඳහන් මෝටර් රථ, පිළිගත් ක්‍රමවේදයක් (ශ්‍රී ලංකා මහා බැංකුව විසින් අනුමත කරන ලද මූල්‍යායතන) තුළින් බලයලත් නියෝජිතයින්/වාහන ආනයනකරුවන් වෙත අවශ්‍ය මුදල් ගෙවන ලද හඳුනාගත් පාරිභෝගිකයන්ගේ ඉල්ලීම මත එම බලයලත් නියෝජිතයින්/වාහන ආනයනකරුවන් විසින් පුද්ගලික පරිහරණය සඳහා ආනයනය කර තිබීම.<br><br>2. ඉහත ලැයිස්තුගත කොන්දේසි සම්පූර්ණ කරන ඕනෑම ආනයනකරුවෙකු හෝ පුද්ගලයකු විසින් එම වාහන මෙම ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කළ දින සිට මාස හතරක් (04) ඇතුළත උපලේඛනය I හි II වන තීරුවේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති නිෂ්පාදන බද්ද ගෙවමින් ශ්‍රී ලංකා රේගුවෙන් නිශ්කාෂණය කිරීමට බලය දීම සඳහා මෙම ගැසට් නිවේදනයේ උපලේඛනය II හි දක්වා ඇති පරිදි ඔවුන්ගේ අයදුම් පත්‍රය සියලුම නීත්‍යානුකූල/නියමිත ලෙස සහතික කරන ලද අදාළ සාක්ෂි පිටපත් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකළ යුතු වේ.<br><br>3. යෝජිත බදු සහනය යටතේ ශ්‍රී ලංකා රේගුවෙන් නිශ්කාෂණය කර ගනු ලබන සියලුම මෝටර් රථ ශ්‍රී ලංකා රේගුව විසින් එම වාහන නිදහස් කළ දින සිට දින 30 ක් ඇතුළත ඉහත 1 හි දක්වා ඇති පරිදි පුද්ගලික නමින් ලියාපදිංචි කළ යුතු වේ. ශ්‍රී ලංකා රේගුවෙන් නිශ්කාෂණය කළ දින සිට දින 30 ක් ඇතුළත ලියාපදිංචි නොකරන ලද ඕනෑම මෝටර් රථයක් ශ්‍රී ලංකා රේගුවෙන් එම මෝටර් රථය නිශ්කාෂණය කරන අවස්ථාවේ දී අදාළ වන නිෂ්පාදන බද්ද ගෙවීමට යටත් වේ. | අදාළ ණයවර ලිපිය විවෘත කරන ලද අවස්ථාවේ දී අදාළ වන නිෂ්පාදන බදු අනුපාතය |

## උපලේඛනය II

2015 ජනවාරි මස සිට 2017 නොවැම්බර් මස දක්වා කාලය තුළ මෝටර් රථ මත නිෂ්පාදන බදු සංශෝධනය නිසා හම්බන්තොට වරාය පරිශ්‍රයේ වර්තමානයේ නවතා ඇති මෝටර් රථ නිශ්කාෂණය මත අංක ................ දරන ගැසට් නිවේදනය පරිදි ගෙවිය යුතු විශේෂ බද්ද සඳහා ඉල්ලීමට වන අයදුම් පත්‍රය

1. අයදුම්කරුගේ නම :

ලිපිනය :

දුරකථන අංකය :

| | |
|---|---|
| 2. වාහනය අයිතිකරුගේ නම : | |
| ලිපිනය : | |
| දුරකථන අංකය : | |
| ජාතික හැඳුනුම්පත් අංකය : | |
| 3. වාහනය ආනයනය කිරීමේ අරමුණ : | පුද්ගලික පරිහරණය/ව්‍යාපාරික අරමුණින් |
| 4. ණයවර ලිපි අනු අංකය : | |
| ණයවර ලිපිය විවෘත කළ බැංකුව : | |
| ණයවර ලිපිය විවෘත කළ දිනය : | |
| ණයවර ලිපියේ ඇතුළත් වටිනාකම (රු.) : | |
| ශ්‍රී ලංකාවට වාහනය ළඟා වූ දිනය : | |
| නෞභාර පත්‍ර අංකය : | |
| වෙළඳ බිල්පත් අංකය : | |
| 5. වාහනයේ වර්ගය : | |
| ඉන්ධන වර්ගය : (පෙට්‍රෝල්, ඩීසල්, දෙමුහුන් පෙට්‍රෝල් හෝ ඩීසල්, විදුලි) | |
| එන්ජින් ධාරිතාවය/එන්ජිමේ මෝටර් බලය : | |
| චැසි අංකය : | |
| එන්ජින් අංකය : | |
| ප්‍රභවස්ථාන රට : | |
| මිල, රක්ෂණය ගැල් කුලිය ඇතුළත් වටිනාකම : | |
| සංයෝජිත වර්ගීකරණ අංකය : | |
| 6. වාහන ආනයනකරුවෙකු/නියෝජිතයකු මඟින් වාහනය ආනයනය කරනු ලැබුවේ නම් : | |
| වාහන ආනයනකරුගේ නම : | |
| ලිපිනය : | |
| දුරකථන අංකය : | |

| | |
|---|---|
| ජාතික හැඳුනුම්පත් අංකය : | |
| වාහනය ආනයනය කිරීම සඳහා මූලික ගෙවීම සිදු කරන ලද දිනය සහ වටිනාකම | |
| ගෙවීමේ ක්‍රමය : | |
| ගෙවන ලද මුදල (රු.) : | |
| අනෙකුත් අදාළ ලියවිලි : | |

නම :...............................................
ජාතික හැඳුනුම්පත් අංකය :...............................................
දිනය :...............................................
අයදුම්කරුගේ අත්සන :...............................................

ඉදිරිපත් කළයුතු ලියවිලි :

1. ණයවර ලිපියේ පිටපතක්
2. නෞභාර පත්‍රයේ පිටපතක්
3. වෙළෙඳ බිල්පතේ පිටපතක්

} ණයවර ලිපිය විවෘත කරන ලද බැංකුව මගින් සහතික කරන ලද

4. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත් වන පරිදි ඉහත සඳහන් වාහනය ආනයනය කිරීමට අදාළ සියලුම ගණුදෙනු ඇතුළත් අදාළ බැංකුව විසින් සහතික කරන ලද වාහන ආනයනකරුගේ බැංකු ප්‍රකාශය/බැංකු ගිණුම් විස්තරය (උදා : ඉහත කී වාහන අයිතිකරු වෙතින් මුදල් ලැබීම, ණයවර ලිපිය සඳහා කරන ලද ගෙවීම් යනාදී)
5. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත් වන පරිදි ඉහත සඳහන් වාහනය ආනයනය කිරීමට අදාළ සියලුම ගණුදෙනු ඇතුළත් අදාළ බැංකුව විසින් සහතික කරන ලද වාහන අයිතිකරුගේ බැංකු ප්‍රකාශය/බැංකු ගිණුම් විස්තරය
6. වාහන ආනයනකරුගේ ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්
7. වාහනයේ අයිතිකරුගේ ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්
8. වාහනයේ අයිතිකරු/පාරිභෝගිකයා විසින් අදාළ වාහනය පුද්ගලික පරිහරණය සඳහා ගෙන් වූ බවට දිවුරුම් ප්‍රකාශයක්
9. වාහනයේ ආනයනකරු/නියෝජිතයා විසින් අදාළ වාහනය පුද්ගලික පරිහරණය සඳහා ගෙන්වූ බවට දිවුරුම් ප්‍රකාශයක්
10. වාහනයේ ආනයනකරුගේ/නියෝජිතයාගේ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය
11. වාහනයේ ආනයනකරුගේ/නියෝජිතයාගේ බදු හඳුනාගැනීමේ අංකය
12. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත්වීම සඳහා ඉල්ලනු ලබන ඕනෑම අනෙකුත් ලියවිල්ලක්

05 - 83

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.